# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1545 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 09/12/2023 පැය 1035

## මාධ්‍ය නිවේදනය

**01. බීඩි කොළ ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2023.12.08 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුරුණෑගල පොලිස් වසමේ මාස්පොත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද බීඩි කොළ කිලෝ ග්‍රෑම් 2700 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ප්‍රවාහනයට යොදා ගත් ලොරි රථයද සමඟින්** අත්අඩංගුවට ගෙන කුරුණෑගල සුරාබදු ඒකකය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන නාගවිල්ලුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුරුණෑගල සුරාබදු ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2023.12.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මකුළුගස්වැව පොලිස් වසමේ ගලේවෙල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මකුළුගස්වැව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රංචමඩබිම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුර.**

2023.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුවරසන්කුලම්

පොලිස් වසමේ පිරමනාවූර් කනත්ත පිටුපස කැළෑ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පුවරසන්කුලම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන නෙළුක්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පුවරසන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2023.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මාන්කුලම් පොලිස් වසමේ මාන්කුලම් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මාන්කුලම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන අම්බල්නගර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුර.**

2023.12.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කාත්තන්කුඩි පොලිස් වසමේ කාත්තන්කුඩි ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **කේරළ ගංජා ග්‍රෑම් 885 ක් හා ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැක සහිත මුදල් රුපියල් 118,791/= ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කාත්තන්කුඩි පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන කාත්තන්කුඩි 06 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කාත්තන්කුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුර.**

2023.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කල්මුණ පොලිස් වසමේ කරකඩ පල්ලියට හැරෙන හන්දිය අසල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 520 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කල්මුණ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කල්මුණ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කල්මුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.12.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වලස්මුල්ල පොලිස් වසමේ වලස්මුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද විදේශීය රටක නිෂ්පාදිත දුම්වැටි 302 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වලස්මුල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**